ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.03.26 චක්‍රලේඛ අංක 24 /2026

සියලුම දිසා කොමසාරිස් වරුන් වෙත,

**<u>සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ) සම්මන්ත්‍රණය</u>**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ බාලදක්ෂ කටයුතු භාර සහය දිසා කොමසාරිස් වරුන් සඳහා පවත්වනු ලබන, වර්ෂයේ පළමු සම්මන්ත්‍රණය **<u>2026 අප්‍රේල් මස 04 වන සෙනසුරාදා දින පෙ.ව 9.00 ට</u>** කොළඹ දිස්ත්‍රික් බාලදක්ෂ මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.

ඒ සඳහා ඔබ දිසාවේ **<u>බාලදක්ෂ සහය දිසා කොමසාරිස්</u>** සහභාගී කරවන මෙන් දන්වා සිටිමු. දැනට බාලදක්ෂ කටයුතු භාර සහය දිසා කොමසාරිස්වරයකු නොමැති නම් ඒ සඳහා සුදුසු අයකු කඩිනමින් නම් කර එවීම අත්‍යවශ්‍ය බව සලකන්න. එදින රැස්වීම සඳහා සහභාගී වන සියලුම දෙනා නිල ඇඳුමෙන් පැමිණිය යුතු බව දන්වා සිටින අතර, මේ සඳහා සහභාගීවන අයගේ නම, තනතුර, දිස්ත්‍රික්කය හා වට්සැප් දුරකථන අංකය slscout1@yahoo.com යන ඊමේල් ලිපිනයට **මාර්තු මස 31** වන දිනට පෙර දැනුම්වත් කරන්න.

බාලදක්ෂ අංශය උසස් මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ඔබ සැමගේ දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කරමු.

මේ පිළිබඳ ඔබගෙන් ලැබෙන සහය අගය කොට සලකමු.

ස්තූතියි,
මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

***කපිල ප්‍රියන්ත***
සහය ප්‍රධාන කොමසාරිස්(බාලදක්ෂ )

***නීතිඥ. මනෝජ් නානායක්කාර***
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

**පිටපත් -**

1. ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් (දැ.ගැ.පි)
2. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික
3. සහය ප්‍රධාන කොමසාරිස්(බාලදක්ෂ) ලිපිගොණුවට